THE CENTER FOR JUSTICE & ACCOUNTABILITY
Bringing Human Rights Abusers To Justice.

# <u>ශ්‍රී ලංකාවේ හිටපු ආරක්ෂක ලේකම්ට එරෙහිව ප්‍රසිද්ධ ජනමාධ්‍යවේදියෙකු ඉලක්ක කොට මරා දැමීම සම්බන්ධයෙන් පවරා ඇති නඩුව ප්‍රසිද්ධ කර ඇත</u>

*ඝාතනයට දස වසරක සැපිරීමත් සමග ලසන්ත වික්‍රමතුංගගේ දියණිය විසින් තමන්ගේ පියා ඝාතනය කිරීම සම්බන්ධයෙන් ගෝඨාභය රාජපක්ෂට එරෙහිව නඩු පවරන ලදී*

***මාධ්‍ය සම්බන්ධතා සඳහා:***
***LISA COHEN***
***(310) 395-2544***
***lisa@lisacohen.org***

**සැන් ෆ්රැන්සිස්කෝ, කැලිෆෝර්නියා 15 අප්‍රේල් 2019** – ප්‍රවීණ ජනමාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංගගේ අනීතික ඝාතනයේ ඔහුගේසම්බන්ධය පිළිබඳව හා රාජපක්ෂ පාලනය විවේචනය කළ බව කියා පැතිරගිය, ක්‍රමානුකූල ජනමාධ්‍ය හිංසනයට එරෙහිව ශ්‍රී ලංකාවේ හිටපු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂට Center for Justice and Accountability විසින් නඩු පවරන ලදී. අප්‍රේල් 4 වැනි දින පවරන ලද සිවිල් නඩුව, කැලිෆෝනියා මධ්‍යම දිස්ත්‍රික්කයේ ඇමරිකානු දිස්ත්‍රික්ක අධිකරණයේ ෆෙඩරල් විනිශ්චයකරුවෙකු විසින් අද දින ප්‍රසිද්ධ කරන ලදී. රාජපක්ෂ ඇමරිකාවේ ද්විත්ව පුරවැසිභාවය දරන්නකු වන අතර, ඇමරිකානු පුරවැසිභාවය ලබා ගත පසු, ඔහු ලංකාවේ ආරක්ෂක ලේකම් ලෙස සේවය කරනු ලැබිය.

CJA නඩුව පවරා ඇත්තේ ලසන්ත වික්‍රමතුංගගේ දියණිය වන අහිම්සා වික්‍රමතුංග වෙනුවෙනි. ලසන්තගේ මරණයෙන් පසු ඔහුගේ ඝාතනය විමර්ශනය කිරීම සඳහා ලංකාවේ දැරූ සියලුම උත්සාහයන් ඇඟිලි ගසීම්වලටද, ප්‍රමාදවීම් වලටද ලක් විය. ඝාතනය සිදුවී දශකයක් පිරිණු නමුත්, ඔහුගේ ඝාතනයට වගකිව යුතු කිසිදු පුද්ගලයෙකුට නඩු පවරා නැත.

"මාගේ පියා ඝාතනයට ලක් වුයේ ඔහු ජනමාධ්‍යවේදියෙක් වූ නිසාත්, ඔහු ජනමාධ්‍ය නිදහස වෙනුවෙන් කැප වුන නිසාය.මෙම නඩුව සිවිල් නඩුවක් වුවත් මගේ මූලික පරමාර්ථය වන්නේ මගේ තාත්තා මරා දැමූ අන්දමත්, ඔහු ඝාතනය කිරීමට අණ දුන් පුද්ගලයන්අධිකරණයක් ඉදිරියේ මුළු ලෝකයටම පෙන්වීමත් ය. මේ තාක් දුරට, ලංකාවේ පොලිසිය විසින් බලවත් විමර්ශනයක් කල ඇති නමුත්, දේශපාලන ඇඟිලි ගැසීම්, යුක්තිය සඳහා යන ගමන අඩපණ කර ඇතැයි" අහිම්සා පැවසයි.

CJA ජ්‍යෙෂ්ට කාර්ය මණ්ඩල නීතිඥ්ය නුෂින් සාර්කරාටි: "ජනමාධ්‍යවේදීන්ට එරෙහි ප්‍රචණ්ඩතාව යනු ජනමාධ්‍ය නිදහස මර්ධනය කිරීම සඳහා රාජපක්ෂ පාලනය විසින් යොදා ගත් යාන්ත්‍රණයකි. එම අපරාධ වලට අදටත් දඬුවම් නොලැබී ඇත. ලංකාවේ මෙම නඩුඉදිරියට ගෙන යෑම පිණිස, අප දැන් ඇමරිකානු අධිකරණයක් ඉදිරියේ සත්‍ය හෙළි කිරීමට උත්සහ කරමු."

2005-2015 මහින්ද රාජපක්ෂ පාලන සාමය පුරා ගෝඨාභය රාජපක්ෂ ලංකාවේ ආරක්ෂක ලේකම් ලෙස සේවය කළේය. දශකකිහිපයක් පුරා විසිර ගිය සිවිල් යුද්ධයේ අවසන් වසර කිහිපයක් තුල යුද්ධය විවේචනය කල අයට විරුද්ධව ක්‍රියා කල අතර, එම විවේචන හේතු කොට ගෙන නිදහස් මාධ්‍යට එරෙහිව රාජපක්ෂ පාලනය විසින් මර්ධනකාරී මෙහෙයුමක් දියත් කරන ලද බව නඩුව චෝදනා කරයි.

එම මෙහෙයුමේ එක් වින්දිතයෙක් වූයේ ලසන්ත වික්‍රමතුංග ය. 2009 ජනවාරි 8 වන දින මුහුණු වසාගත් ප්‍රහාරකයින් විසින් ලංකා අගනුවර වන කොළඹ හිදී ඝාතනය කරන ලදී. තමාගේ ඝාතනයෙන් පසුව පල කිරීම සඳහා ලසන්ත අවසන් කතුවැකියක් ලියා තිබුණි. එම කතුවැකිය දැන් ලෝක ප්‍රසිද්ධ ලියවිල්ලකි. ලසන්ත වික්‍රමතුංගගේ අවමගුලට ලොව පුරාවෙන් සෙනග රොක් විය. ඔහුගේ ඝාතනය හෙළා දකිමින් විදේශ රාජ්‍යන්ගෙන්ද, මාධ්‍ය නිදහස වෙනුවෙන් පෙනී සිටින ජාත්‍යන්තර සංවිධාන ද ප්‍රකාශ නිකුත් කරන ලදී. ආණ්ඩු පක්ෂයේ දූෂණ වංචා සහ යුධ සමයේ සිදුවූ අපරාධ සම්බන්ධයෙන් ලිපි පල කරන්නෙකු ලෙස ලසන්ත වික්‍රමතුංග ප්‍රකට විය. එම ලිපි නිසා ඔහු රාජපක්ෂ රෙජීමයේ විවේචනයටත්, තර්ජනවලටත් ලක්විය.

ගෝඨාභය රාජපක්ෂ විසින් අණ දෙන ලද යුධ හමුදාවට අයත් නිලධාරීන් විසින් ලසන්ත වික්‍රමතුංග ඝාතනයට වග කිව යුතු බව එම නඩුව චෝදනා කරනු ඇත. එම ඝාතනයට සම්බන්ධ විමර්ශනය යටපත් කිරීමට හා බාධා කිරීමට ගෝඨාභය රාජපක්ෂ යටතේ ක්‍රියාත්මක වුනු පොලිසිය උත්සහ කල බව නඩුවේ සඳහන් වී ඇත.

අප්‍රේල් 7 වැනි දින ලොස් ඇන්ජලීස් නුවර දී ගෝඨාභය රාජපක්ෂ ට පුද්ගලිකව මෙම නඩුවේ නොතිසි සහ අහිම්සා ගේ චෝදනාවේ පිටපතක් භාර දෙන ලදී. ඒ ඔහු තම ඥාතීන් බැහ දැකීම සදහා ඇමරිකාවට සංචාරය කල විටය. ඔහුට විරුද්ධ චෝදනා වලට පිළිතුරු සැපයීමට, ඔහුට අප්‍රේල් 29 වන තුරු කල් ඇත.

තම පියා වෙනුවෙන් අහිම්සා වික්‍රමතුංග පවරා ඇති මෙම නඩුව, Schonbrun Seplow Harris & Hoffman හා Minz Group සහ Ideal Investigations යන ආයතන වල සහය ඇතිව පවරන ලද්දකි.

මෙම නඩුව පිලිබඳ වැඩිදුර තොරතුරු සඳහා සහ නඩුවේ ලිපි ගොනු ලබා ගැනීමට මෙම වෙබ් අඩවියට පිවිසෙන්න: https://cja.org/what-we-do/litigation/wickrematunge-v-rajapaksa/

**

**<u>යුක්තිය සහ වගවීම සඳහා මධ්‍යස්ථානය (Centre for Justice and Accountability)</u>**

යුක්තිය සහ වගවීම සඳහා මධ්‍යස්ථානය (CJA) යනු වධහිංසාව, යුද අපරාධ, මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ සහ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් වැලැක්වීමට නවීන නීතිමය කටයුතු තුලින් වගවීම පිළිබඳ ගෝලීය ජාලය ශක්තිමත් කරන, ප්‍රතිපත්ති සහසංක්රමන යුක්ති මූලෝපායන් හරහා ලෝකය පුරා විසුරුවා හැරීම සඳහා කැපවූ සැන් ෆ්රැන්සිස්කෝ හි පදනම් ව පිහිටා ඇති මානව හිමිකම් සංවිධානයකි.

CJA විසින් විපතට පත් වූවන්ට හා යුක්තිය ඉටු කර ගැනීම සඳහා ගොදුරු වූවන් හා යුක්තිය ඉටු කර ගැනීම සඳහා කර ඇති කටයුතු අතර සෝමාලියානු සියාඩ් බාරේ තන්ත්රයේ හිටපු ආරක්ෂක අමාත්‍යවරයාට එරෙහිව චිලී ක්‍රියාකරු සහ ගායක වික්ටර් ජරා ඝාතනය කිරීම සහ සිරියාවේ අසාද් මිලිටරි පාලනය විසින් යුධ වාර්තාකාරිය වන මරී කොල්වින් ඉලක්ක කර ගාතනය කිරීම සුවිශේෂි හා සාර්තක වූ අවස්ථාවන් ය. **පිවිසෙන්න:** www.cja.org.

## U.S. වධ හිංසා වලට ලක්වුණු වින්දිතයන් ආරක්ෂා කිරීමේ පනත සහ ඇමරිකා එක්සත් ජනපදය තුල මානව හිමිකම් උල්ලංගනය පිළිබඳව සිවිල් නඩු පැවරීම

ගොටාභය රාජපක්ෂ ට විරුද්ධව CJA විසින් පවර ඇති නඩුව ලංකාවේ සිදු වුනු අධිකරණ පටිපාටිවලින් තොර ඝාතන සහ මානව වර්ගයාට එරෙහි අපරාධ චෝදනා ගෙන එනු ඇත.මෙම චෝදනා ඉදිරිපත් කර ඇත්තේ ෆෙදෙරල් ඇමරිකානු නීති දෙකක් යටතේය.එනම් ඇමෙරිකානු වධ හිංසා වලට ලක්වුණු වින්දිතයන් ආරක්ෂා කිරීමේ පනත සහ විදේශීය වදහිංසා පනත යටතේය. මෙම නීති දෙක යටතේ මානව හිමිකම් උල්ලංගනය වූ වින්දිතයන්ට, ඇමෙරිකාවේ රක්ෂණය පතන හෝ ඇමරිකාවේ එම මොහොතේ සිටින චූදිතයන්ට විරුද්ධව නඩු පැවරීමට ඉඩ කඩ සැපයේ.

## US වධ හිංසා වලට ලක්වුණු වින්දිතයන් ආරක්ෂා කිරීමේ පනත [TORTURE VICTIMS PROTECTION ACT]

1991 නීතියක් බවට පත් වුනු **US වධ හිංසා වලට ලක්වුණු වින්දිතයන් ආරක්ෂා කිරීමේ පනත** ඇමරිකාවේ පුරවැසියන්ට හා පුරවැසියන් නොවන අයට විදෙස් රටවල සිදුවූ අනීතික ඝාතන සහ වධ හිංසා වලට එරෙහිව නඩු පැවරීමේ අයිතිය තහවුරු කරනු ඇත. විදෙස් වදහිංසා පනත වගේම මෙම නීතිය ද තුලින් එම මොහොතේ ඇමෙරිකාවේ හෝ ඇමරිකානු අධිකරණ බල ප්‍රදේශයක් තුලදී අපරාධ නඩු නොවන සිවිල් නඩු පැවරීමට හැකි වනු ඇත. නීතියට පත් වුන දින සිට, විදෙස් රටවල හමුදා නිලධාරීන්, රාජ්‍ය නිලධාරීන් හා

පැරා මිලිටරි නිලධාරීන් මානව හිමිකම් උල්ලංගනය කිරීම සම්බන්ධයෙන් නඩු පැවරීමට ඇමෙරිකානු වධ හිංසා වලට ලක්වුණු වින්දිතයන් ආරක්ෂා කිරීමේ පනත යටතේ සිදු වී ඇත.

**මෙම පනත පිළිබඳව තවත් තොරතුරු සඳහා මෙම වෙබ් අඩවියට පිවිසෙන්න:** https://cja.org/what-we-do/litigation/legal-strategy/torture-victim-protection-act/

## US විදෙස් අලාභහානි සිදු කිරීමේ වැරදි පිලිබඳ පනත [ALIEN TORT STATUTE]

විදෙස් වධ හිංසා පනත යනු 1789 දින නීතියක් වුනු ඇමරකානු ෆෙදෙරල් නීතියක් ය. මෙම නීතිය යටතේ ඇමරිකානු පුරවෙසියෙකු නොවන ඕනෑම මානව හිමිකම් උල්ලංගනය වූ වින්දිතයකුට, උල්ලංගනය පිටරටක සිදු වුවත්, ඇමරිකානු බල ප්‍රදේශයක වෙසෙනවුදිතයකුට විරුද්ධව නඩු පැවරිය හැක.

මෙම නිතිය මුලිනම හඳුන්වා දෙනු ලබන්නේ මංකොල්ලකෑම් වැනි උල්ලංඝනය කිරීම වැනි ඇතැම් අන්තර්ජාතික උල්ලංඝනයන්ට අදාළව අධිකරණ බලය ලබා දීම සඳහායි. 1980 දී, එක්සත් ජනපද උසාවිය විසින් "වධහිංසාකාරියකු" සියලු මනුෂ්‍ය වර්ගයාගේ සතුරෙකු වූ අතර එය වර්තමානයේ සමාන කොල්ලකරුවකුට සමාන වූවක් ලෙස සලකන හෙයින් එවැන්නන් එක්සත් ජනපද අධිකරණය බලයට යටත් විය යුතුය. වධහිංසාව, මානව වර්ගයාට එරෙහි අපරාධ, යුද අපරාධ සහ ජනඝාතන වැනි ජාත්‍යන්තර නීති උල්ලංඝනය කිරීම් සඳහා ATS යොදා ගෙන තිබේ.

**මෙම පනත පිළිබඳව තවත් තොරතුරු සඳහා මෙම වෙබ් අඩවියට පිවිසෙන්න:** https://cja.org/what-we-do/litigation/legal-strategy/the-alien-tort-statute/.